පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2015 අගෝස්තු
பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2015 ஆகஸ்ட்
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – AUGUST 2015
දර්ශනය -PHG IV
**සංක්ෂිප්ත බටහිර දර්ශනය**

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 10කින් සමන්විත වේ.
ප්‍රශ්න පහකට(05) පමණක් පිළිතුරු සපයන්න
කාලය පැය තුනක් (03) පමණයි.

---

1. පුරාණ ග්‍රීක දර්ශනයේ ස්වභාවය ඔබ නිර්වචනය කරන්නේ කෙසේ ද? මෛලේසියානු චින්තකයින් ප්‍රථම දාර්ශනිකයන් ලෙස සැලකෙන්නේ ඇයි? පැහැදිලි කරන්න.

2. **එක්කෝ**

   'සොෆිස්ට්වාදීන් මූලික ප්‍රායෝගික මිනිසුන් වූ බව සහ මනුෂ්‍ය ස්වභාවය ගැන වඩා වැඩි අවධානයක් යොමු කිරීමට අවස්ථාව සැලසුවන්ද විය' යනුවෙන් ප්‍රකාශ කිරීම නිවැරදිද, සාකච්ඡා කරන්න.

   **නැත්නම්**

   දාර්ශනික චින්තාවන් පිළිබඳ සොක්‍රටීස්ගේ දැක්ම පහදා දෙමින් තම දාර්ශනික විශ්ලේෂණයන්හිදී ඔහු භාවිතා කළ විධික්‍රමය කෙටියෙන් විභාග කරන්න.

3. ප්ලේටෝගේ ආකෘතිවාදය (Theory of form) විවේචනාත්මකව විභාග කරන්න.

4. තෝමස් ඇක්වයිනාස් දෙවියන්ගේ පැවැත්ම තහවුරු කළේ කෙසේ ද?

5. මධ්‍යතන දාර්ශනිකයෝ තර්ක බුද්ධියට වඩා භක්තියට මුල්තැන දුන්බව කීම නිවැරදිද පහදා දෙන්න.

6. මධ්‍යතන යුගයේ ඇරිස්ටෝටල් නැවත සොයාගැනීම ඔබ විස්තර කරන්නේ කෙසේ ද?

7. 'මම සිතමි එමනිසා මම වෙමි' (I think there for I am)යනුවෙන් ඩේකාට් අදහස් කළේ කුමක් ද? සැකය පිළිබඳ කාටිසියානු විධික්‍රමය කෙටියෙන් විස්තර කරන්න.

8. අනුභූතිවාදය (Empiricism) යන වචනයේ අර්ථය කෙටියෙන් නිර්වචනය කරන්න. ජෝන් ලොක්ගෙන් **හෝ** ඩේවිඩ් හියුම්ගෙන් අනුභූතිවාදයට ලැබූ දායකත්වය සාකච්ඡා කරන්න.

9. ඇත විට්ගන්ස්ටෛන්ගේ දාර්ශනික විග්‍රහයේ මූලික සංකල්ප ගෙනහැර දක්වා කෙටියෙන් විභාග කරන්න **හෝ** ඉමැනුවෙල් කාන්ට්ගේ දර්ශනය කෙටියෙන් සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් ඕනෑම **දෙකක්** (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    i. ඓතිහාසික භෞතිකවාදය.
    ii. 'සහජ සංකල්ප'.
    iii. සාන්දෘෂ්ඨිකවාදය **හෝ** තර්කාණුසාරී අණුවාදය.
    iv. දර්ශනය සහ දේවවාදය.
    v. භාෂාමය ක්‍රීඩා.